සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. රටක තීන්දු ගැනීමේ ක්‍රියාවලිය සඳහා සියළු දෙනාම සම්බන්ධවීම හඳුන්වනු ලබන්නේ,
(1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ලෙසයි. (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ලෙසයි.
(3) නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය ලෙසයි. (4) නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ලෙසයි.

02. කිසියම් රටක මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරාදීම හඳුන්වනු ලබන්නේ කුමන නමකින් දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) බලය විමධ්‍යගත කිරීම. (2) බලය මධ්‍යගත කිරීම.
(3) බලය බෙදීම. (4) බලය කේන්ද්‍රගත කිරීම.

03. යහපත් පාලනයක මූලික ගුණාංග පිළිතුරු අතරින් තෝරන්න.
(1) අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම.
(2) රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය නොමැති වීම.
(4) දූෂණයෙන් වංචාවෙන් තොර රාජ්‍ය පාලනය

- **පහත වගන්ති ඇසුරින් 4, 5, 6 යන ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න.**

A ආහාර ද්‍රව්‍ය B ඇඳුම් පැළඳුම් C යන්ත්‍ර සූත්‍ර D පොහොර
E ගොඩනැගිලි F කෘෂි රසායන ද්‍රව්‍ය

04. ඉහත භාණ්ඩ වලින් පාරිභෝගික භාණ්ඩ ගණයට අයත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) AB (2) BC (3) CE (4) DF

05. ඉහත භාණ්ඩ වලින් අන්තර් භාණ්ඩ ගණයට අයත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) AB (2) BC (3) CE (4) DF

06. ඉහත භාණ්ඩ වලින් ප්‍රාග්ධන භාණ්ඩ ගණයට අයත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) AB (2) BC (3) CE (4) DF

07. ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඉදිරිපත් කළ චින්තකයා පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) ජොහාන් ගැල්ටුන් (2) ටී. බී. ටයිලර් (3) චාර්ල්ස් ඒ. එල්වුඩ් (4) කේ. සී. වියර්

08. ශ්‍රී ලංකාවේ පාලන කටයුතු කරගෙන යාමේ දී ඍජුවම ඡන්ද දායකයන්ගේ අදහස් විමසීමට ලක්කරනු ලබන්නේ පහත අවස්ථා වලින් කුමන අවස්ථාවේ දී ද?
(1) ප්‍රාරම්භනය (2) පුනරාවර්ථනය (3) ජනමත විචාරණය (4) ප්ලේබිසයිඩ් ක්‍රමය



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **පහත වගන්ති ඇසුරින් 9 හා 10 ප්‍රශ්න වලට පිළිතුරු සයපන්න.**

A - පළාත් සභාව කැඳවීම, වාර අවසන් කිරීම, විසුරුවා හැරීම
B - පළාත් සභාව ඇමතීම හා සංදේශ යැවීම.
C - මධ්‍යම ආණ්ඩුය හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම.
D - පළාත් ආණ්ඩුකරුට උපදෙස් ලාබා දීම.
E - පළාත් අයවැය ලේඛනය සකස් කිරීම.
F - පලාත් ආර්ථික සංවර්ධන සැළසුම් සකස් කිරීම.

09. පලාත් ආණ්ඩුකරු සතු බලතල හා කාර්යයන්ට අයත් වගන්ති කාණ්ඩය වන්නේ,
(1) ABC (2) BCD (3) CDE (4) DEF

10. පළාත් මහ ඇමති හා ඇමති මණ්ඩලය සතු බලතල හා කාර්යයන්ට අයත් වගන්ති කාණ්ඩය වන්නේ,
(1) ABC (2) BCD (3) CDE (4) DEF

11. බහු සංස්කෘතික ජන සමාජයක යහපත් පුරවැසියෙකු විසින් ප්‍රගුණ කල යුතු ගුණාංගයක් වන්නේ,
(1) අන්‍යමත නොසලකා හැරීම. (2) අන්‍ය ආගම් වලට අවමන් කිරීම.
(3) ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම. (4) ආගමික වැඩ සටහන් සංවිධානය කිරීම.

12. මූලික අවශ්‍යතා හා වුවමනා එකිනෙකින් වෙනස් වන්නේ කෙසේදැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) අවශ්‍යතා සීමිතවන අතර වුවමනා අසීමිත වේ.
(2) වුවමනා සීමිතවන අතර අවශ්‍යතා අසීමිත වේ.
(3) වුවමනා මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් වේ.
(4) පුද්ගලයන්ගේ අවශ්‍යතා විවිධවන අතර වුවමනා සීමිත වේ.

13. II ලෝක යුද්ධයෙන් පසු ලෝක පරිමාණ සංග්‍රාම නොමැති වුවත් රටවල් අතර යුද්ධ දක්නට ලැබුණි. ඒවාට උදාහරණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ප්‍රංශය හා ජර්මනිය අතර පැවති යුද්ධය.
(2) ප්‍රංශය හා ජපානය අතර පැවති යුද්ධය.
(3) ඉන්දියාව හා පාකිස්ථානය අතර පැවති යුද්ධය.
(4) කුරුස යුද්ධය.

14. ශ්‍රී ලංකා ජනරජයේ පරාමාධිපත්‍ය බලයට අයත්වන මූලිකම බලතල තුන ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, මූලික යුතුකම්
(2) පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය
(3) පාලන බලතල, ඡන්ද බලය, මූලික යුතුකම්
(4) නිදහස, අයිතිවාසිකම්, සමානාත්මතාවය

15. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ''සංවෘත'' ලැයිස්තුවට අයත් බලතල වලට අයත් වන්නේ මොනවාදැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) පළාත් සභාවට අයත් බලතලයි.
(2) පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුව හවුලේ භුක්ති විඳින බලතලයි.
(3) මධ්‍යම ආණ්ඩුවට පමණක් හිමිවන බලතලයි.
(4) පළාත් පාලන ආයතන වලය අයත් බලතලයි.

16. ඉතා ඉහල සංකීර්ණ බහු සංස්කෘතික ජන සමාජය ඇති රටවල් දෙකක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) ශ්‍රී ලංකාව හා ඉන්දියාව (2) ඉන්දියාව හා ශ්‍රී ලංකාව
(3) ඉන්දියාව හා ඇමරිකාව (4) ඇමරිකාව හා බ්‍රිතාන්‍යය

- **පහත වගන්ති ඇසුරින් 17 හා 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ඛණිජතෙල් නිෂ්පාදනය B දුම්රිය සේවය
C දුරකථන සේවා D මංමාවත් ඉදිකිරීම
E ඇඟලුම් නිෂ්පාදනය

17. ඉහත පිළිතුරු වලින් නිෂ්පාදනයේ දී රාජ්‍ය අංශය පමණක් දායකවන අංශ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) AB (2) BC (3) CD (4) DE

18. ඉහත පිළිතුරු අතරින් රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම නිශ්පාදනයට දායක වන අංග ඇතුළත් පිළිතුර තොරන්න.
(1) AB (2) BC (3) CD (4) DF

19. ගැටුම් නිරාකරණය සඳහා යොදාගන්නා මූලිකම හා සරළම ක්‍රමය පිළිතුරු අතරින් තෝරන්න.
(1) සාකච්ඡා කිරීම. (2) උපදේශනය. (3) මැදිහත්කරණය. (4) ඒකගතාවය.

20. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාශ බෙදා වෙන්කිරීමේ දී ඒ සඳහා යොදාගන්නා නිර්ණායක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) භූමිය, ශ්‍රමය (2) භූමිය, ප්‍රාග්ධනය (3) භූමිය, ජනගහනය (4) ජනඝනත්වය, භූමිය

21. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් හා සාධාරණ මැතිවරණය සහතික කිරීමට අවශ්‍ය සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) සියළු දෙනාටම ඡන්ද අයිතිය ලබා දීම.
(2) සියළු ඡන්ද අපේක්ෂකයන්ට නිදහසේ සිය කටයුතු කරගැනීමට හැකියාව ලබා දීම.
(3) නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
(4) ඕනෑම වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම.

22. ඇමරිකා එක්සත් ජනපදය සංධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට හේතු පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) ජාතික ආරක්‍ෂාව තහවුරු කරගැනීම. (2) භූගෝලීය විෂමතාවයන් පැවතීම.
(3) නැගී ආ ප්‍රංශ බල ව්‍යාප්තිය. (4) ඇමරිකාව කුඩා රාජ්‍යයක් වීම.

23. ස්විස්ටර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) මහා මාර්ග (2) කර්මාන්ත
(3) විදේශ කටයුතු (4) බෝවන රෝග වැළැක්වීම

24. ආර්ථිකයකට ස්වභාව ධර්මයෙන් නොමිලේ ලැබෙන භාණ්ඩ හඳුන්වන නම පිළිතුරු අතරින් තෝරන්න.
(1) ආර්ථික භාණ්ඩ (2) ආර්ථික නොවන භාණ්ඩ
(3) පාරිභෝගික භාණ්ඩ (4) ප්‍රාග්ධන භාණ්ඩ

25. ශ්‍රී ලංකාවේ වෙළඳපල ආර්ථික තුළ දක්නට ලැබෙන ලක්‍ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ආර්ථිකය අර්ධ විවෘත ස්වභාවයක් ගැනීම. (2) ආනයනය ආදේශනය කර්මානත ඇරඹීම.
(3) ආනයනය සඳහා සීමා පැනවීම. (4) රජය විනිමය පාලනයෙන් ඉවත්වීම.

26. කාර්මික ආරවුල්, වතුකම්කරු ආරවුල්, විසඳීම සඳහා බහුලව භාවිතා කරන ගැටුම් නිරාකරණ ක්‍රමය වන්නේ,
(1) සාකච්ඡා කිරීම. (2) උපදේශනය.
(3) සහමන්ත්‍රණය හා කේවල් කිරීම. (4) මැදහත්කරණය.

27. ගැටුම් නිරාකරණය සඳහා යොදාගන්නා ''විනිසීම'' හා සම්බන්ධ ප්‍රධාන ලක්‍ෂණ පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන මූලිකව හා සරළව ක්‍රමය වේ.
(2) ප්‍රජාතන්ත්‍රවාදීව ආරවුල් විසඳීම සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමයයි.
(3) මෙය යුද්ධමය නොවන සාමකාමී මැදිහත්වීමක් ලෙස හැඳින්වේ.
(4) සාක්ෂි ලබා දීම නඩු ඇසීම විධිමත්ව සිදුකරයි.

28. රටක නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති බවට විදහාපාන ලක්‍ෂණයක් වන්නේ,
(1) චෝදනා පත්‍රයක් නැති වූවද පුද්ගලයන් අත් අඩංගුවට ගත හැකිය.
(2) නීතිය ඉදිරියේ සියළුදෙනා සමානබව.
(3) අතීතයට බලපාන නීති යටතේ වරදකරුවන්ට දඬුවම් දියහැකිය.
(4) සැවොම නීතියට ගරු කිරීම හා නීතිය අභිබවා යාම.

29. කිසියම් රටක ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව පවත්වාගෙනයාම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ කුමක් දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) තරගකාරී පක්‍ෂ ක්‍රමයක් පැවතීම.
(2) සර්වජන ඡන්දබලය පදනම් කරගෙන පාලකයන් පත්කිරීම.
(3) ඡන්ද කොට්ඨාශ ක්‍රමය.
(4) යහපත් ආර්ථික මට්ටමක් පැවතීම.

30. තිරසර සංවර්ධනයේ දී සැළකිය යුතු කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ස්වාභාවික සම්පත් සංරක්ෂණය.
(2) සලාක ක්‍රමයක් ක්‍රියාත්මක වීම.
(3) දේශීය යැපුම් කෘෂි අංශය දිරිගැන්වීම.
(4) සංවර්ධනය වැඩි වශයෙන් දේශීය සම්පත් වලින් සපුරා ගැනීම.

31. ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) දේශපාලන අස්ථාවරබව ඇති වීම.
(2) මූලික හා මානව අයිතිවාසිකම් ආරක්ෂා වීම.
(3) සාමය හා ආරක්ෂාව අහිමි වීම.
(4) පුද්ගල මානසිකත්වය අවපීඩනය වීම.

32. පහත පිළිතුරු අතරින් සදාචාරාත්මක යුතුකම් වලට අයත් පිළිතුර තෝරන්න.
(1) නීතියට ගරු කිරීම, වැඩිහිටියන්ට ගරුකිරීම.
(2) රජයට බදු ගෙවීම, වැඩිහිටියන්ට ගරුකිරීම.
(3) නීතියට ගරු කිරීම, රජයට බදු ගෙවීම.
(4) වැඩිහිටියන්ට ගරුකිරීම. කුලදරුවන්ට සැළකීම.

33. රටතුළ නීත්‍යානුකූලවම එක් දේශපාලන පක්ෂයක් පමණක් ක්‍රියාත්මක වන රටවලට උදාහරණ පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) චීනය, කියුබාව, ජපානය
(2) චීනය, කියුබාව, ප්‍රංශය
(3) චීනය, කියුබාව, ඇමරිකාව
(4) චීනය, උතුරු කොරියාව, කියුබාව

34. රටක විධායකය, ව්‍යවස්ථාදායකයට වගකීමට ඍජුවම බැඳී නැති ආණ්ඩුක්‍රමය හඳුන්වනු ලබන්නේ,
(1) ජනාධිපති ආණ්ඩුක්‍රමය ලෙසය.
(2) කැබිනට් ආණ්ඩුක්‍රමය ලෙසය.
(3) මිශ්‍ර ආණ්ඩුක්‍රමය ලෙසය.
(4) වෙස්මිනිස්ටර් ආණ්ඩුක්‍රමය ලෙසය.

35. ක්‍රි. පූ. 6වන සියවසේ ඉන්දියාවේ ''වජ්ජි'' ජනපදයේ තිබූ ''සප්ත අපරිහානීය ධර්ම'' වලට අයත් පිළිතුර තෝරන්න.
(1) අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම.
(2) සමඟිව රැස්වී සමඟිව සාකච්ඡාකර සමඟිව විසිරයාම.
(3) වහලුන් විදේශිකයන් පාලනයට සම්බන්ධ වීම.
(4) පුරවැසියන් පමණක් පාලනයට සම්බන්ධ වීම.

36. සියළු ජන කොටස් රාජ්‍ය තුළ පොදු හැඟීමෙන් කටයුතු කිරීම,
(1) ජනාධිපති ආණ්ඩුක්‍රමයක් පවතින රටක තිබිය යුතු ලක්ෂණයකි.
(2) කැබිනට් ආණ්ඩුක්‍රමයක් පවතින රටක තිබිය යුතු ලක්ෂණයකි.
(3) සංධීය රාජ්‍යයක සාර්ථක පැවැත්මට අවශ්‍ය ගුණාංගයකි.
(4) ඒකීය රාජ්‍යයක සාර්ථක පැවැත්මය අවශ්‍ය ගුණාංගයකි.

37. ක්‍රි. ව. 1815 දී ශ්‍රී ලංකාවේ බලය බෙදීම සඳහා ඉංග්‍රීසීන් විසින් පත්කරන ලද නිලධාරියා වූයේ,
(1) ගම්භාර නම් නිලධාරියාය.
(2) ගාමණි නම් නිලධාරියාය.
(3) ගමික නම් නිලධාරියාය.
(4) රෙසිඩන්ට් නම් නිලධාරියාය.

38. සංවර්ධනය සම්බන්ධයෙන් ගත්විට මෑත කාලීනව වැඩිපුර සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.
(1) තිරසර සංවර්ධනය (2) පුද්ගල සංවර්ධනය (3) සදාචාර සංවර්ධනය (4) සමාජ සංවර්ධනය

39. BIMSTEC (බිම්ස්ටෙක්) සංවිධානයට අයත් රටවල් පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) ප්‍රංශය, බෙල්ජියම, බ්‍රිතාන්‍ය, ස්වීඩනය
(2) ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව
(3) ඉතාලිය, ප්‍රංශය, ඇමරිකාව, ඉන්දියාව
(4) බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව

40. ''අ'' කොටසේ වගන්ති ''ආ'' කොටස සමඟ ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| 01. ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණයකි. | A මූලික අවශ්‍යතා තෘප්තකර ගැනීම. |
| 02. තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණකි. | B බහු ජාතික සමාගම් බිහිකිරීම. |
| 03. පරිවර්ථන ආර්ථිකයක දැකිය හැකි ලක්ෂණයකි. | C පෞද්ගලික ව්‍යවසාය දිරිගැන්වීම. |

(1) ABC (2) BAC (3) CBA (4) BCA

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය - II

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක්ද සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) ජාතික රාජ්‍යයක මූලික ලක්‍ෂණ 02 ක් ලියන්න.

(ii) ව්‍යවස්ථාදායකයට අයත් මූලික කාර්යයන් 02 ක් ලියන්න.

(iii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණ 02 ක් ලියන්න.

(iv) ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ පැවති පාලන ආයතන බලය විමධ්‍යගතකරන ඇතැම් ලක්‍ෂණ පැවති බවට උදාහරණ 02 ක් ලියන්න.

(v) ඒකීය රාජ්‍යයක ලක්‍ෂණ 02 ක් ලියන්න.

(vi) ශ්‍රී ලංකාවේ දක්නට ඇති ප්‍රධාන සංස්කෘතීන් 02 ක් ලියන්න.

(vii) සංස්කෘතිය යන්න පැහැදිලි කිරීමට නිර්වචන ඉදිරිපත්කළ චින්තකයන් දෙදෙනෙක් නම් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ දැනට සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියානිසා අත්වී ඇති වාසි 02 ක් ලියන්න.

(ix) රටක තිරසර සංවර්ධනය ක්‍රියාත්මක වීමේ දී සැලකිය යුතු කරුණු 02 ක් ලියන්න.

(x) ගැටුම් ඇතිවීම කෙරෙහි බලපෑ හැකි හේතු 02 ක් ලියන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) ''අතීතයේ සිට ලෝකයේ විවිධ රාජ්‍යතුළ විවිධ පාලනක්‍රම පැවතුනත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මේ දක්වා පවතින ජනප්‍රියම පාලන ක්‍රමයකි''

(i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන ස්වරූප 02ක ලියන්න. (ල. 02)

(ii) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්ථමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත්වන ආකාරය පිළිබඳව කරුණු තුනක් සඳහන් කරන්න. (ල. 03)

b. ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ල. 02)

(03) ''යුරෝපය කේන්ද්‍රකර ගනිමින් ලොව පුරාම ජාතික රාජ්‍ය ආරම්භ වන්නේ මධ්‍යතන වැඩවසම් සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය බිඳ වැටීමත් සමඟය''

(i) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු 02 ක් ලියන්න. (ල. 02)

(ii) එංගලන්තය ප්‍රංශය වැනි රටවල් ප්‍රබල ජාතික රාජ්‍ය ලෙස නැගී සිටීමය හේතු 03 ක් ලියන්න. (ල. 03)

(iii) (a) නූතන රාජ්‍යයක ප්‍රධාන ලක්‍ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(b) ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(04) සමාජයන් තුළ ජීවත්වන සියළු දෙනා කිසියම් පිළිගත් ජීවන රටාවකට අනුව හැඩගැසී සිටීම සංස්කෘතිය ලෙස හඳුන්වයි.

(i) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක 03 ක් ලියන්න. (ල. 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක

a. යහපාලනය බිඳ වැටීමට හේතු 03 ක් ලියන්න. (ල. 03)

b. එම එක් හේතුවක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(05) ඕනෑම ආර්ථික ක්‍රමයකට මුහුණු දීමට සිදුවන ප්‍රශ්න මූලික ආර්ථික ප්‍රශ්න ලෙස හඳුන්වයි.

(i) මූලික ආර්ථික ප්‍රශ්න 02 ක් ලියන්න. (ල. 02)

(ii) නිෂ්පාදන සාධක තුනක් දක්වා ඒවාට කරන ගෙවීම් තුනක් දක්වන්න. (ල. 03)

(iii) (a) ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි 03 ක් දක්වන්න. (ල. 03)

(b) ඉන් එකක් විස්තර කරන්න. (ල. 02)

(06) අර්ථ ක්‍රමයක් යනු මිනිසා මුණුදෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජ සංවිධානය වී ඇති ආකාරයයි.

(i) වෙළඳපල අර්ථිකය හඳුන්වන්න. (ල. 02)

(ii) පරිවර්ථන ආර්ථිකයක ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. ආර්ථිකයක දැකිය හැකි ප්‍රධාන අර්ථක්‍රම 03 සඳහන් කරන්න. (ල. 03)

b. ඉන් එක් අර්ථක්‍රමයක් පිළිබඳ විස්තර කරන්න. (ල. 02)

(07) සෑම සමාජයකම ඇති ගැටුම් පුද්ගල විවිධත්වයේ ප්‍රතිඵලයකි.

(i) ගැටුම් පුළුල් ලෙස වර්ග කිරීමේ දී බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න. (ල. 02)

(ii) ගැටුම් වලට මුල්වන පුද්ගල මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමුවිය හැකි ක්‍රියාකාරකම් 03 ක් ලියන්න. (ල. 03)

(iii) a. සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ගැටුම් අවමකර ගැනීමට ඔබ විසින් වර්ධනය කරගත යුතු ගුණාංග 03 ක් දක්වන්න. (ල. 03)

b. ඉන් එකක වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 02)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(3) | 3 -(4) | 4 -(1) | 5 -(4) | 6 -(3) | 7 -(1) | 8 -(3) | 9 -(1) | 10 -(4) |
| 11 -(3) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(3) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(1) | 20 -(3) |
| 21 -(3) | 22 -(1) | 23 -(3) | 24 -(2) | 25 -(4) | 26 -(3) | 27 -(4) | 28 -(2) | 29 -(4) | 30 -(1) |
| 31 -(2) | 32 -(4) | 33 -(4) | 34 -(1) | 35 -(2) | 36 -(3) | 37 -(4) | 38 -(1) | 39 -(4) | 40 -(2) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

(01) (i) * එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
* භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය යන අංගවලින් සමන්විත වීම.
* වෘත්තීය නිලබල පැලැන්තියක් මගින් පාලන බලය මෙහෙයවීම.
* අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමි වීම.

(ii) නීති සම්මත කිරීම / මුදල් පාලනය / විධායකය පාලනය

(iii) * නාමික හා සත්‍ය ලෙස විධායකය දෙආකාරය.
* ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වේ.
* ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සබඳතාවක් පවතී.
* විධායකය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකියයි.
* විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකිය.

(iv) * අනුරාධපුර යුගය තුළ පණ්ඩුකාභය රජු විසින් ගම්පාලනය කිරීම සඳහා ''ගම්භාර'' ''ගාමිණී'' වැනි නිලධාරීන් පත් කිරීම.
* මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රදේශීය පාලකයන් පත් කිරීම.
* බටහිර ජාතීන් සංක්‍රමණය වීමත් සමග තවදුරටත් ප්‍රාදේශීය පාලන නිලධාරීන් පත් කිරීම.
* ක්‍රි. ව. 1815 දී බ්‍රිතාන්‍ය විසින් පළාත් මට්ටමින් රෙසිඩන්ට් වරයකු පත් කිරීම.

(v) * ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායකය හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම
* මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත විමධ්‍යගත කර තිබීම.
* මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.
* මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය විට විමධ්‍යගත කරන ලද පරිපාලන බලතල නැවත පවරා ගත හැකි වීම.

(vi) * සිංහල සංස්කෘතිය / දෙමළ සංස්කෘතිය / මුස්ලිම් සංස්කෘතිය / ක්‍රිස්තියානි සංස්කෘතිය

(vii) ටී. බී. ටයිලර් හා චාර්ලන් ඒ එල්වුඩ්

(viii) * සේවා නියුක්තිය ඉහලයාම
* විදේශ විනිමය ඉපැයුම් ඉහළයාම.
* ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම.
* ඉහල ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම.
* යටිතල පහසුකම් වර්ධනයවීම ...... (පිටු 85)

(ix) * මූලික අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම.
* අනාගත පරම්පරාව සමග ඒකමතික වීම.
* ජනතා සහභාගීත්වය ඇතිකර ගැනීම.
* ස්වභාවික සම්පත් සංරක්ෂණය
* පරිසරය ආරක්ෂා කර ගැනීම.
* සමාජ සුරක්ෂිතතාව
* අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.

(x) * විවිධ ප්‍රතිරූප / වෙනත් අදහස් / සීමා ඇති වීම / අවහිරතා ඇති වීම / මානසික තත්ත්වය / පරාවර්ථ ඉටු නොවීම.

(02) (i) සෘජු / වක්‍ර (නියෝජන)

(ii) * වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාලවීම.
* වර්තමාන රාජ්‍ය අධික ජනගහනයකින් යුක්ත වීම.
* සියළු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුතාවය.
* සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.

(iii) a. * එය මහජන පැවැත්ම මත සිදුවන නිසා සහ පාලනය සඳහා නියෝජිතයන් තෝරාගනු ලබන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත අනුවය.
* ආණ්ඩුබලය හිමි වන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත් වූ පක්ෂයට හෝ කණ්ඩායමටය.
* නීති සම්පාදනය කරනු ලබන්නේ ද මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්තට අනුවය.

b. විස්තරයට අදාළව ලකුණු ලබා දෙන්න.

(03) (i) * රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
* පුනරුදය
* වැඩවසම් ක්‍රමය බිඳවැටී ධනවාදි ආර්ථිකයක් ගොඩනැගීම.
* විද්‍යාත්මක දැනුම වර්ධනය.

(ii) ජාතික ඒකාග්‍රතාව / යුධ හා නාවික ශක්තිය / දියුණු ආර්ථික තත්වය / එම ජාතීන් සතු නිර්මාණශීලී හැකියාව

(iii) (a) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය බලය
(b) පිළිතුරු අනුව

(04) (i) * විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරන, විවිධ භාෂා කතා කරන පුද්ගලයන් එකට ජීවත් වීම.
* ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතියට ආවේණික සිරිත් විරිත් ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම.
* එක ජන කොටසක වුව ද ප්‍රාදේශීයව විවිධත්වයන් දැකිය හැකිවීම.
* තම දේශසීමා වලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සමග සම්මිශ්‍රණය වී බහු සංස්කෘතික සමාජ ගොඩනැගීම.
* ලෝකය එකම විශ්ව ගම්මානයක් බවට පත් වීම.

(ii) පිහිටීම / සංක්‍රමණ / ආක්‍රමණ / විවිධ ජාතීන් වෙළඳාම පිණිස පැමිණීම / ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම.

(iii) a. * අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම.
* රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමභාවය
* රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
* නිලධාරීවාදය.
* රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය නොමැති වීම.
* අල්ලස් හා දූෂණය ඉහළ යාම.
* රාජ්‍ය පාලකයන් වගකීමෙන් තොරවීම.
* පෞද්ගික අංශය ජාතික අභිලාෂ නොතකා හැරීම.

b. විස්තරයට අදාළව ලකුණු ලබා දෙන්න.

(05) (i) * කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
* කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
* කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

(ii) නිෂ්පාදන සාධකය - ඒවාට කරන ගෙවීම්
භූමිය - බදු කුලිය
ශ්‍රමය - වැටුප
ප්‍රාග්ධනය - පොලිය
ව්‍යවසායකත්වය - ලාභය

(iii) (a) නිෂ්පාදනය - බෙදාහැරීම - පරිභෝජනය
(b) පිළිතුර අනුව

(06) (i) නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය නැත්නම් රජයේ අවම මැදිහත්වීමක් මගින් වෙළඳපල ක්‍රියාත්මක වීමට ඉඩ ලබාදෙන ආර්ථික ක්‍රමය.

(ii) * පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
* පෞද්ගලික දේපල අයිතියට ඉඩ සලසා දීම.
* ආර්ථික ලිහිල්කරණය.

(iii) a. 1. ධනවාදී අර්ථ ක්‍රමය. 2. සමාජවාදී අර්ථ ක්‍රමය. 3. මිශ්‍ර අර්ථ ක්‍රමය.
b. විස්තරයට ලකුණු ලබා දෙන්න.

(07) (i) අභ්‍යන්තර ගැටුම් / අන්තර්ජාතික ගැටුම්

(ii) * ආගමික වතාවත් කෙරෙහි යොමුවීම.
* මනෝවිද්‍යාත්මක අභ්‍යාස මගින්
* උපදේශනය මගින්
* ස්වභාවික පරිසරය නිරීක්ෂණය මගින්

(iii) a. ආත්ම අවබෝධය / ඉවසීම / කරුණාව හා මෛත්‍රිය /නිර්මාණාත්මක චින්තනය / ඵලදායී තීරණ ගැනීම / මුදිතාව /දරා ගැනීම / අවිහිංසක බව / ඵලදායී සන්නිවේදනය
b. විස්තරයට ලකුණු ලබා දෙන්න.